## Abstract 05

# ත්‍රිපිටකයට අන්තර්ගත නොවූ ධර්ම කොට්ඨාස පිළිබඳ විමර්ශනයක්

**පූජ්‍ය. වීරකැටියේ චන්දානන්ද හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*weerakatiyechandananda@gmail.com*

ත්‍රිපිටක ග්‍රන්ථ තුළ බුද්ධ භාෂිත මෙන් ම ශ්‍රාවක භාෂිත ද තිබෙන බව ප්‍රකට ය. සාම්ප්‍රදායික පිළිගැනීම වන්නේ අසූ දෙදහසක් ධර්මස්කන්ධ බුදුන් වහන්සේ විසින් දේශිත බව සහ දෙදහසක් ශ්‍රාවක භාෂිත වන බව යි. එහෙත් මෙම ධර්ම කොට්ඨාස සියල්ල දැනට සුරක්ෂිත ද යන්න පිළිබඳව මෙතෙක් පර්යේෂණයක් සිදු වී නොමැත. **ශ්‍රී ලංකාවේ** මෙන්ම **බුරුම, සියම්, කාම්බෝජ** යනාදී ථේරවාදී රටවල ත්‍රිපිටක සංස්කරණ විමසන විට එකී සංස්කරණවල යම් යම් අඩු වැඩි තැන් ඇති බව පැහැදිලිව දැකිය හැකි කරුණකි. භාණක පරම්පරා විසින් මුඛපරම්පරාවෙන් ගෙන ආ දහම් කොටස් ග්‍රන්ථාරූඪ කිරීම් හා සංස්කරණයන්ට භාජනය වීම් නිසා **පෙය්‍යාලං** නයින් දැක්වීම සහ පුනරුක්ති ඉවත් කිරීම් හේතුවෙන් ද කාලය විසින් ද නෂ්ටප්‍රාප්ත ධර්ම කොට්ඨාස ඇති බව පහසුවෙන් පැමිණිය හැකි නිගමනයකි. මෙම ධර්ම කොටස් හඳුනා ගැනීමට කිසියම් පර්යේෂණයක අවශ්‍යතාවක් පවතී. එහි එක් උපාය මාර්ගයක් වශයෙන් ත්‍රිපිටක ග්‍රන්ථයන්හි නොමැති එහෙත් අට්ඨකථා ග්‍රන්ථයන් තුළ ඇති බුද්ධභාෂිත හා ශ්‍රාවක භාෂිත හඳුනා ගැනීම දැක්විය හැකි ය. ත්‍රිපිටක ග්‍රන්ථයන්හි ඇතැම් සූත්‍රවල නැති ඇතැම් කොටස් පිළිබඳව අටුවා ග්‍රන්ථ තුළ ද විභාග වෙයි. ප්‍රථම සංගීතියේ දී සංගායනාවට භාජනය නො වුණු **කුලුම්බ සූත්‍රය, රජෝවාද සූත්‍රය, තික්ඛින්ද්‍රිය සූත්‍රය, චතුපරිවට්ට සූත්‍රය** හා **නන්දෝපනන්ද සූත්‍රය** නිදසුන් ලෙස දැක්විය හැකි ය. මෙම සූත්‍ර පිළිබඳව **සුමංගලවිලාසිනියෙහි** මෙන් ම **ධම්මසංගණී අට්ඨකථාවෙහි** ද සඳහන් වේ. එසේ ම බුද්ධවචන නොවේ යැයි අටුවාකරුවන් විසින් බැහැර කරනු ලබන **රට්ඨපාලගජ්ජිත** වැනි සූත්‍ර ද අටුවාවන්හි දක්නා ලැබේ. මෙය අටුවා මතයක් බව ද මතක තබා ගත යුත්තකි. කෙසේ වෙතත් මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වන්නේ ත්‍රිපිටකයෙහි අවිද්‍යමාන අටුවාවල විද්‍යමාන මෙකී ධර්ම කොට්ඨාස පිළිබඳ හඳුනා ගැනීමක් කිරීම ය.

**ප්‍රමුඛ පද :** අට්ඨකථා, ත්‍රිපිටකය, බුද්ධභාෂිත, සංගීති, ශ්‍රාවකභාෂිත